# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## පොල් වගාකිරීමේ මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු /2024

**පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් (ආ.පො.උ.) සේවාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා**

**ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### තනතුර: තොරතුරු තාක්ෂණ නිලධාරී (ආ.පො.උ.) (JM 1-2) -II ශ්‍රේණිය

**සේවා ස්ථානය :-** ප්‍රධාන කාර්යාලය, තනතුරු 01යි

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක්

සමඟ

රාජ්‍ය / සංස්ථා හෝ රජය පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණ කටයුතු පිළිබඳ වසරක සේවා පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය** : JM1-2
**වැටුප් පරිමාණය** : රු. 43,355 - 755x10 - 1135x18 - 71,335

**වයස** : වයස අවු 22 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

### තනතුර: නීති නිලධාරී (ආ.පො.උ.) (JM 1-2) - II ශ්‍රේණිය

**සේවා ස්ථානය :-** ප්‍රධාන කාර්යාලය, තනතුරු 01යි

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හා වසරකට නොඅඩු සක්‍රීය සේවා පළපුරුද්ද ලබා තිබීම / ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයකු වශයෙන් දිවුරුමෙන් අනතුරුව වසරකට නොඅඩු සක්‍රීය සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් කාණ්ඩය** : JM1-2
**වැටුප් පරිමාණය** : රු. 43,355 - 755x10 - 1135x18 - 71,335

**වයස** : වයස අවු 22 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

### තනතුර: විගණන නිලධාරී (ආ.පො.උ.) (JM 1-2) - II ශ්‍රේණිය

**සේවා ස්ථානය :-** ප්‍රධාන කාර්යාලය, තනතුරු 01යි

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

මූල්‍ය පාලන විෂයක් සහිතව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් / වාණිජවේදී උපාධිය හෝ පිළිගත් වරලත් වෘත්තීය ගණකාධිකාරී ආයතනයක මධ්‍යම පරීක්ෂණය සමත්වීම / ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම.

සහ

රාජ්‍ය / සංස්ථා හෝ රජය පිළිගත් ආයතනයක ගිණුම් හා විගණන කටයුතු පිළිබඳ වසරක සේවා පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය** : (JM1-2)
**වැටුප් පරිමාණය** : රු. 43,355 – 755x10 - 1135x18 - 71,335

**වයස** : වයස අවු 22 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

### තනතුර: සහකාර අලෙවි ප්‍රවර්ධන කළමනාකරු (වතු) (ආ.පො.උ.) II ශ්‍රේණිය

**සේවා ස්ථානය :-** ප්‍රධාන කාර්යාලය, තනතුරු 01යි

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

අලෙවි කළමනාකරණය විෂය සහිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්

සමඟ

රාජ්‍ය /සංස්ථා හෝ රජය පිළිගත් ආයතනයක අලෙවි කළමනාකරණ කටයුතු පිළිබඳ වසර 04 ක සේවා පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය** : (JM1-2)
**වැටුප් පරිමාණය** : රු. 43,355 – 755x10 - 1135x18 - 71,335

**වයස** : වයස අවු 22 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වෙනත් කොන්දේසි,**

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- **ඒ අනුව 2024.07.19 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ.**

එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේනම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.
- සියලුම අයදුම්පත් 2024.08.02 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**සභාපති,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල්**
**කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඉහත තනතුරු සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එමෙන්ම එසේ බාගත කරගැනීමේ යම් අපහසුතාවයක් ඇති වුවහොත් තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකරන ලෙස දන්වමි.**
**https://coconutsrilanka.lk/**